සැ. යු. - 2011.02.11 වැනි දින පළවූ අංක 1,693 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,694 - 2011 පෙබරවාරි මස 18 වැනි සිකුරාදා - 2011.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 100 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |

| | පිටුව |
|---|---|
| රජයේ නිවේදන ... ... ... | — |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 101 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2011 පෙබරවාරි මස 25 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2011 පෙබරවාරි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2011 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

99- B 080198—3,350 (2011/02)
A1–

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2011 අංක 42

D/RF/RECT/879/NY.

**ශ්‍රී ලංකා නාවික හමුදාව**

නිත්‍ය නාවික බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2009 ජූලි මස 14 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිත්‍ය බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

අද්මිරාල් වසන්ත කුමාර් ජයදේව කරන්නාගොඩ, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, එන්ඩීසී, පීඑස්සී, ශ්‍රීලංනාහ - එන්ආර්එක්ස් 0046.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2009 අගෝස්තු මස 10 වැනි දින,
කොළඹ දී ය.

02-428

D/DISC/NY/175.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීම

2010 ජූලි මස 31 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා නාවික බලකායේ පහත නම් සඳහන් නිලධාරීන් අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත :

ලුතිතන් (ස්වේ) නන්දජීව කුමාර සූරියබණ්ඩාර, එන්වීඑක්ස් 5288, ශ්‍රීලංස්වේනාහ ;
*වැඩ බලන උප ලුතිතන්* (ස්වේ) කුරුප්පු අප්පුහාමිලාගේ නිසාන්ත ධම්මික, එන්වීඑක්ස් 5374, ශ්‍රීලංස්වේනාහ ;
*වැඩ බලන උප ලුතිතන්* (ස්වේ) මුල්ලෙරියාවගේ ලලිත් රවීන්ද්‍ර කුලතිලක සේනාරත්න, එන්වීඑක්ස් 5378, ශ්‍රීලංස්වේනාහ ;
*වැඩ බලන උප ලුතිතන්* (ස්වේ) දොන් යතීන්ද්‍ර නිරංජන් වීරකෝන්, එන්වීඑක්ස් 5379, ශ්‍රීලංස්වේනාහ.

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 ජූලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

02-429

---

DRF/21/RECT/2726.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරී 2008 පෙබරවාරි මස 02 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිතන් (උපකරණ පාලක) රන්ජිත් විපුලනන්ද ප්‍රනාන්දු කෝරලගමගේ, ශ්‍රීලකාහ (නි/62641).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2008 සැප්තැම්බර් මස 05 වැනි දින,
කොළඹ දී ය.

02-430

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීවී 5683.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''මෝටර් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.02.06 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "මෝටර් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "මෝටර් සිටි (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජනවාරි මස 12 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-356

---

පීවී 70235.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''ක්ලීන් කෙයා හවුස්කීපිං සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2009.12.04 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ක්ලීන් කෙයා හවුස්කීපිං සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ක්ලීන් කෙයා හවුස්කීපිං සර්විස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ 10
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-355

---

පීවී 66295.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''බෙල් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.11.21 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "බෙල් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "බෙල් ඉන්ස්ටිටියුට් ඔෆ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජනවාරි මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-354

---

පීවී 65419.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''සහන් ඔටෝමෝටිව් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.09.11 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සහන් ඔටෝමෝටිව් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "සහන් ඔටෝමෝටිව් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජනවාරි මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-353

පීවී 4645.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''ඕ ඊ එස් එම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2005.05.30 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඕ ඊ එස් එම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ඕ ඊ එස් එම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජනවාරි මස 14 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-352

---

පීවී 14187.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ ''ස්ටාර් ටවර් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්'' හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1999.06.16 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ස්ටාර් ටවර් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "ස්ටාර් ටවර් ඩිවලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2011 ජනවාරි මස 18 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-357

**සෙලාන් බැංකුව පීඑල්සී - මඩකලපුව ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2010.12.01 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0730-08073620-001.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවි 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් අයි. ටී. ගුණතිලක විසින් සහතික කරන ලද 2007 ජුනි මස 30 දිනැති අංක 1459 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙහිවල පදිංචි කුමාරසාමි රාජකුලේන්ද්‍රන් යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් පනස්පන්ලක්ෂ අනූනව දහස් හත්සිය හැත්තෑ හතරයි ශත හැත්තෑ නවයක (රු. 55,99,774.79) මුදලක්, 2009 නොවැම්බර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 55,99,774.79 මුදල ද, 2009 දෙසැම්බර් මස 01 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 1459 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ රාගම් පත්තුවේ, අළුත්කුරු කෝරළයේ. ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දඬුගම්පේරුව ඒකකය තුළ දඬුගම පිහිටි බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් සාදන ලද 2007.07.07 වැනි දිනැති අංක 342/2007 දරන සැලැස්මේ නිරූපනය කරනු ලබන අඹගහවත්ත නමැති මීගමුව පාර වරිපනම් අංක 397 සහ 399 දරන ඉඩමේ ලොට් 2ඒ ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් සාදන ලද 1985.08.24 වැනි දිනැති අංක 214 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 ද, නැගෙනහිරට : කොළඹ-මීගමුව මහා මාර්ගය ද, දකුණට : එකී අංක 214 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 සහ 4 සහ බස්නාහිරට : එකී අංක 214 දරන සැලැස්මේ සඳහන් ලොට් 3 ද යන මායිම් තුළ පර්චස් විසි එකයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 21.3) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මැනීමක් වේ :-

පෙර කී දඹුගම පිහිටි බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. වී. පෙරේරා විසින් සාදන ලද 1985.08.24 වැනි දිනැති අංක 214 දරන සැලැස්මේ නිරූපණය කරනු ලබන අඹගහවත්ත නමැති ඉඩමේ ලොට් 2 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : මහා මාර්ගය ද, දකුණට : ලොට් 3 සහ 4 සහ බස්නාහිරට : ලොට් 3 ද යන මායිම් තුළ පර්චස් විසි එකයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 21.3) ක් විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව බී 199/179හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

02-506/1

---

**සෙලාන් බැංකුව පීඑල්සී - බොරලැස්ගමුව ශාඛාව**

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් 2009.09.29 වැනි දින පවත්වන්නට යෙදුණු රැස්වීමේ දී, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0340-යු 93123-101.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ආර්. රාජසුන්දරම් විසින් සහතික කරන ලද 2006 නොවැම්බර් මස 29 දිනැති අංක 453 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම රත්මලාන පදිංචි කොන්ඩගමගේ රොහාන් ප්‍රනාන්දු යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හැටහයලක්ෂ හැට හතරදහසක් (රු. 66,64,000) මුදලක්, 2010 අප්‍රේල් මස 20 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 66,64,000 මුදල ද, 2010 අප්‍රේල් මස 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට විසි නවය (29%) බැගින් වූ පොළිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුණු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 453 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර පී. මුතුකුමාරණ මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ රත්මලාන පිරිවෙන පාර දිගේ පිහිටි බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1986.05.11 වැනි දිනැති අංක 797 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කාඹරංගහවත්ත නමැති, ගොඩනැගිලි, ගස්, වගා, බිම් සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ ලොට් 2 ලකුණ කළ (බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් සාදන ලද 1983.06.20 වැනි දිනැති අංක 1305 දරන සැලැස්මේ නිරූපණය වන ඉඩමේ නැවත මැනීමක් සහ අතුරු බෙදීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : කලින් ජේ. තෙපානිස් සොයිසා ගේ ඉඩම වන දැන් කේ. ලිලියන් ඩයස් සහ කේ. ටෙක්ලා ඩයස්ගේ ඉඩම ද, නැගෙනහිරට : පාර ද, දකුණට : අංක 797 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 සහ 3 සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස යන මායිම් තුළ පර්චස් හයයි දශම තුනයි දෙකක් (අ. 0, රූ. 0, පර්. 6.32) විශාල ඉඩම. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 2023/15හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් තුළ උඩින් යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග :-

1. බලයලත් මිනින්දෝරු බී. එච්. ඒ. ද සිල්වා විසින් සාදන ලද 1986.05.11 වැනි දිනැති අංක 797 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ප්‍රමාණයෙන් රූඩ් දෙකයි, පර්චස් එකයි දශම හතයි නවයක් (අ. 0, රූ. 2, පර්. 1.79) විශාල ලොට් 3 ලකුණු කළ (අඩි 10ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 1610/186හි ලියාපදිංචි කර ඇත.

2. බලයලත් මිනින්දෝරු එල්. ආර්. එල්. පෙරේරා විසින් සාදන ලද 1977 අගෝස්තු මස 15 වැනි දිනැති අංක 1743 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ප්‍රමාණයෙන් පර්චස් හතරයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 4.25) විශාල ලොට් බී ලකුණු කළ (පොදුවේ පාවිච්චි කිරීම පිණිස පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස. මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එම් 929/251හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

02-506/2

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ගිණුම් අංකය : 1860011680.
ණය ගිණුම් අංකය : 420785 සහ 455108.
ලොකු පනාගොඩගේ සුජීව කුමාරසිරි.

2010 ඔක්තෝබර් මස 29 වැනි දින පවත්වන ලද රැස්වීමක දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් මෙලෙස නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. කේ. ජයවර්ධන විසින් 2008 ජනවාරි මස 17 වැනි දින සහතික කරන ලද අංක 3701 සහ 2008 ජුනි මස 27 වැනි දින අංක 3947 දරන දැන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ලෙස හඳුන්වනු ලබන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් හි නමට ලියන ලද්දා වූ බැඳුම්කර යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ලොකු පනාගොඩගේ සුජීව කුමාරසිරි ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කර යටතේ රුපියල් මිලියන දෙකක් සහ තුන් ලක්ෂ හතලිස් අට දහස් හාරසිය හතලිස් එකයි ශත හතලිස් හතක (රු. 23,48,441.47) මුදලක් 2009 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල් මිලියන දෙකක් සහ තුන්ලක්ෂ හතලිස් අට දහස් හාරසිය හතලිස් එකයි ශත හතලිස් හතක (රු. 23,48,441.47) මුදල අය කර ගැනීම සඳහා සහ 2009 ඔක්තෝබර් මස 01 වැනි දින සිට දේපළ විකිණීමේ දිනය දක්වා කාලයට රුපියල් 19,73,866.49ක මුදල මත 21% වැඩිපුර වාර්ෂික පොළිය සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තා වූ යම් ගෙවීම් වෙතොත් ඒවා ද අඩුකොට එකී අංක 3701 සහ 3947 දරන බැඳුම්කර මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස් කොට ඇත්තා වූ ද මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ සහ පරිශ්‍ර කොළඹ 12, හල්ස්ඩෝෆ් වීදියේ අංක 99හි අනුඥාලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

### උපලේඛනය

බලයලත් මිනින්දෝරු පී. පුංචිහේවා විසින් 2006 සැප්තැම්බර් මස 16 වැනි දින සාදන ලද පිඹුරු අංක 4301හි දැක්වෙන බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හෝකන්දර උතුරේ ජයගත් මාවතේ පිහිටි දෙල්ගහලන්ද නම් ඉඩමේ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පවත්නා සියලු දේත් සමග බෙදා වෙන් කරන ලද ලොට් 2 ලෙස සළකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : කේ. පී. ජයසූරිය සහ අනෙක් අයට අයිති ඉඩම ද. නැගෙනහිරට : පිඹුරු අංක 259හි පිහිටි ලොට් 5 කොටස ද, දකුණට : එම කී පිඹුරු අංක 259හි ලොට් 6 ද, බස්නාහිරට : ලොට් 1 ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 4301ට අනුව පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1679/147 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

තව ද, පහත සඳහන් මාර්ග වෙන්කරය මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිවාසිකම් සහ එයට අනුබද්ධිත අනෙකුත් අයිතිවාසිකම් ද සමග යි.

බලයලත් මිනින්දෝරු එච්. එම්. ටී. ජේ. පිටවෙල විසින් 2000 දෙසැම්බර් මස 02 වැනි දින සාදන ලද පිඹුරු අංක 259හි දැක්වෙන පෙර කී හෝකන්දර උතුරේ පිහිටි දෙල්ගහලන්ද නම් ඉඩමේ බෙදා වෙන් කරන ලද ලොට් 6 ලෙස සලකුණු කර ඇති බිම් කොටසට මායිම්, උතුරට : පාර, කේ. පී. ජයසූරිය සහ අනෙක් අයට අයිති ඉඩම සහ ලොට් 2, 3, 4 සහ 5 යන කොටස් ද, නැගෙනහිරට : ලොට් 1, 2, 5, 7 සහ 9 කොටස් ද, දකුණට : ලොට් 9, 10, 11, 12 සහ 13 කොටස් ද, බස්නාහිරට : ලොට් 10, 11, 12, 13 සහ එම ඉඩමේම ඉතිරි කොටස ද යන මායිම් තුළ පෙර කී පිඹුරු අංක 259ට අනුව පර්චස් විස්සයි දශම නමයයි හතක් (අ. 0, රූ. 0, පර්. 20.97) විශාල ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G1669/210 වෙළුම/පත්‍රිරුව යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ආර්. දුනුවිල මිය.,
සමාගම් ලේකම්.

02-467

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.